උඩරට නර්තන සම්ප්‍රදාය.

Covid – 19 සති පාසල (සබරගමුව)

කාර්යය පත්‍රිකාව

නර්තනය - 9 ශ්‍රේණිය

11- වාරය

ජූනි මාසය දෙවන සතිය, (ජූනි 08 සිට ජූනි 12 දක්වා කාලය)

---

නිපුණතා මට්ටම : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම : වන්නම් ගයමින් නටමු. (සිංහරාජ වන්නම)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඔබට සිංහරාජ වන්නමේ බෙර පදය මාත්‍රා 4න් 4ට තාල තැබීය හැකි දැයි බලන්න.

දෙවන පියවර : එම තාල රූපයටම වන්නමේ තානම හා කවි ගායනා කරන්න උත්සාහ කරන්න.

තුන්වන පියවර : ඔබට මාත්‍රා 4 තාලයට අලංකාර මාත්‍රා තුනක් නිර්මාණය කලහැකිදැයි බලන්න.

හතරවන පියවර : මෙම වන්නමේ තානම කවිය කස්තිරම පාඩම් කරන්න.

**සිංහරාජ වන්නම**

තිත :- මාත්‍රා 4 මහ තනිතිත
බෙර පදය :- දොදොංත තකු දොම්
තානම :- තනත් තනෙන තම් - දනත් තනෙන තම්
දනත් තනෙන තම් - දන තා නා තන
තනත් තනෙන තම් - දනත් තනෙන තම්
දනත් තනෙන තම් - දන තා නා

කවිය :- පෙරත් කලෙක සිහ රජෙක් වැටුණු මහ - ළිඳක් තුළෙක ඉබි ලඩෙක් කරපු වැඩ
හැරත් මෙහෙම යස වැඩක් උණේ නැත - චිරත් කලෙක පැවතුමක් යසයි හැඩ

දුරත් බැලුම නොව ළඟත් බලන අය - හටත් එලෙස වෙයි කැටත් තබම් දඩ
වටත් අයට දැනෙනටත් කියම් මම - රටක් වටින සිහ රජ වන්නමෙ හැඩ

කස්තිරම :- තකට තකට තක තරිකිට කුංදත් /// රුංතක ජිංතක ජිංතක ජිංකුඳ ///
තාග්ග ජිංතක තරිකිට කුංදත් // රුංතක ජිංතක තරිකිට කුංදත් තා

සැකසීම - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලීය
සෞන්දර්ය අංශය වෙනුවෙන්,
එම්. ජී. රංගන එම්. මුණසිංහ මයා,
රඹුක මහා විද්‍යාලය,
පොතුපිටිය, කලවාන.
voice - 0719227246